---

**බෝපේ පෝද්දල ප්‍රාදේශීය සභාව**

**ගාල්ල දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 01 දින ද ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2012 අප්‍රේල් 27 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 ඔක්තෝබර් 30 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

### 1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව බෝපේ පෝද්දල ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට බෝපේ පෝද්දල ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිපල හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට 2011 වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු මුද්දර ආදායම රු.5,739,938 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.7,365,631 ක් ලෙස දක්වා තිබීමෙන් ආදායම් ණයගැතියන් රු.1,625,693 කින් වැඩියෙන් දක්වා තිබුණි.

### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.103,976,287 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිපල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.16,113,401 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.9,140,220 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000' | රු.000' | රු.000' |
| (i) | වරිපනම් හා බදු | 6,100 | 7,355 | 20,339 |
| (ii) | බදු කුලී | 2,611 | 2,233 | 590 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 253 | 293 | 126 |
| (iv) | වෙනත් ආදායම් | 24,514 | 22,756 | 29,288 |

### 2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 586,293 |
| (ii) | මුද්දර ගාස්තු | 23,365,632 |

### 2.2.3 කඩකාමර බදු දීම

ලබුදූව වෙළඳ සංකීර්ණය සහ කලේගාන පොදු වෙළඳපොළ කඩ කාමර 57 පිළිබඳව 2013 මැයි 03 දින සිදු කරන ලද ස්ථානීය පරීක්ෂාවේ දී ගිවිසුම්ගත විධිවිධාන අනුව කටයුතු කර නොතිබූ බව අනාවරණය විය.

#### (අ) ලබුදූව වෙළඳ සංකීර්ණය

(i) දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ 2010 දෙසැම්බර් 27 දිනැති, අංක:ද.ප.පා./ ප.පා.කො./ 2010/01 චක්‍රලේඛයෙහි 05 ඡේදය ප්‍රකාරව කඩ බදු දීමේ දී සෑම ගිවිසුමක් ම වසර 03 කට වරක් යාවත්කාලීන කළයුතු බව දක්වා ඇතත්, ලබුදූව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 40 බදු ගිවිසුම් අළුත් කර නොතිබුණි.

(ii) කඩ කාමරවල වර්ෂ 05 කට වැඩි කාලයක සිට බදු මුදල සංශෝධනය කර නොතිබුණි.

(iii) කඩ කාමර අංක 09, 14, 15, 17, 26, 31, 34, 36, 38, 39 සහ 40 වසා තිබුණි.

(iv) කඩ කාමර අංක 01, 02, 03, 04, 05, 06, 07, 08 සහ 13 ඉදිරිපිට අලෙවි භාණ්ඩ වෙළඳාම සඳහා රැස්කර තිබුණි.

(v) ගිවිසුමේ 02 වන කොන්දේසිය අනුව මාසික බදු මුදල සෑම මසකම 15 වන දිනට පෙර ගෙවිය යුතු වුවද, කඩ කාමර 15 කින් මාස 04 – 23 ක් දක්වා වූ කාල පරාසයක් තුළ රු.115,200 ක බදුකුලී හිඟව පැවතුණි.

(vi) ගිවිසුමේ 04 වන කොන්දේසිය අනුව බදු ගැණුම්කාර පක්ෂය විසින් බදු ගත් දේපල අතුරු බදු නොදිය යුතුය යන්න දක්වා ඇතත්, ස්ථානීය පරීක්ෂාවේ දී කඩ කාමර 10 ක් අතුරු බදු දී තිබුණු බව අනාවරණය විය.

**(ආ) කලේගාන පොදු වෙළඳපොල**

(i) සභාව සතු කඩ කාමරවල වර්ෂ 05 කට වැඩි කාලයක සිට බදු මුදල සංශෝධනය කර නොතිබුණි.

(ii) කඩ කාමර අංක 01, 02, 04, 05, 06, 08, 09, 10, 12, 13, 14, 15, 16 සහ 17 වසා තිබුණි.

(iii) ගිවිසුමේ 03 වන කොන්දේසිය අනුව මාසික බදු මුදල සෑම මසකම 10 වන දිනට පෙර ගෙවිය යුතු වුවද, කඩ කාමර 16 කින් මාස 05 – 31 ක් දක්වා වූ කාල පරාසයක් තුළ රු.119,350 ක බදුකුලී හිඟව පැවතුණි.

## 2.3 නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත භෞතික සම්පත්

අත් ට්‍රැක්ටර් දෙකක් හා බවුසරයක් විගණන දිනය වූ 2013 මැයි 03 දින වනවිට ද නිශ්ක්‍රීයව සභා පරිශ්‍රය තුල ගාල් කර තිබූ බව නිරීක්ෂණය විය. මෙම වත්කම් අළුත්වැඩියා කිරීමට හෝ අළුත්වැඩියා කළ නොහැකි තත්ත්වයේ පවතින්නේ නම් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1988 අංක 74 දරන පනතින් සංශෝධිත 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනතේ අවශ්‍යතාවයන් අනුව සභාවේ සභාපති, උප සභාපති ඇතුළු මන්ත්‍රීවරු 08 දෙනෙකු විසින් 2012 වර්ෂය සඳහා විගණන දිනය වූ 2013 ඔක්තෝබර් 25 දින වනවිටත් අදාල වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා දී නොතිබුණි.

(ආ) 2010 මාර්තු 10 දිනැති හා අංක PF/R/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වරයාගේ ලිපිය ප්‍රකාරව අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබු අතර සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ඇ) 2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 2.5 සේවක ණය

සභාවේ සේවය කරන ලද සේවකයන් (මාරු වී ගිය / විශ්‍රාම ගිය) 22 දෙනෙකුගෙන් අයකර ගතයුතුව තිබූ රු.394,504 ක ණය ශේෂයක් 2012 වර්ෂයට පෙර සිට අයවීම් හිඟහිටව තිබුණි.

## 2.6 අභ්‍යන්තර විගණනය

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් ද සිදුකර නොතිබු අතර 2006 අගෝස්තු 28 දිනැති හා අංක : PE/F/S/4(xiii) දරන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි.

---

## 03. පද්ධති හා පාලන

---

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය